# අලි පවුලේ සබඳතා





**මුත්‍රා ඉව කිරීමෙන් එකිනෙකා හඳුනා ගැනීමට අලින්ට හැකියාව ඇත. තිහක් පමණ සිටින අලි රංචුවක ළඟ නොසිටින සගයන් සොයා ගැනීම ඉව ඇල්ලීමෙන් හා සිටින ස්ථාන පිළිබඳ සිතියම් සිතේ මවා ගැනීමෙන් සිදු කරන බවට පරීක්ෂණයකින් හෙළිවී තිබේ.**

සංඛ්‍යාවෙන් විශාල රංචු වශයෙන් සැරිසරන විට එකිනෙකට යාබදව සිටීමට, ඉව ඇල්ලීම හා කල්පනාවෙන් සිටීම ද උපයෝගී කරගන්නේ යැයි කෙන්යාවේ වනගත අලින් පිළිබඳ අධ්‍යයනයකින් පෙන්වා දී ඇත. ඇම්බෝසෙලි ජාතික වනෝද්‍යානයේ ජීවත් වන අලි රංචු 36 ක් පිළිබඳ සාන්ත ඇන්ඩෲස් විශ්වවිද්‍යාලයය අධ්‍යයනයක් සිදු කර ඇත. එහි තොරතුරු, රෝයල් සොසයිටි (Royal Society)මඟින් නිකුත් කරන Biology Letterනැමැති සඟරාවේ පළකර ඇත.

ගැහැනු සතුන්ගේ නායකත්වය යටතේ සැදුම්ලත් වල් අලි රංචු ආහාර පිණිස ඇවිදිමින් එකට ජීවත්වෙති. ස්වකීය කලාපයේ සැරිසරන විට කුඩා කණ්ඩායම් වශයෙන් වෙන්වී යෑම හෝ තම සගයන් අල්ලා ගැනීම වැළැක්වීම සඳහා පවුලේ සාමාජිකයන් එකිනෙකා පිළිබඳ සැලකිලිමත් වීම සැමවිටම කළ යුතුය. එදිනෙදා කටයුතු ගැන විනා දිගුකල් මතකයේ තබාගැනීමේ ශක්තිය අලින්ට නොතිබීම ඊට සාධක විය හැකිය.

ශාන්ත ඇන්ඩෲස් විශ්වවිද්‍යාලයයේ මනෝ විද්‍යාඥයන් විසින් බිම තිබී සොයා ගනු ලැබූ ඇතින්නකගේ මුත්‍රා සාම්පලයක් ගෙන රැහේ අලින් මුලා කිරීම පිණිස ඉදිරිපත් කර ඇත. ඒ, මොහොතකට කලින් ඇතින්න එතැනින් ගමන් කර ඇති බව හැඟවීම සඳහා ය. එහෙත්, සිදු වූයේ මුත්‍රා සාම්පලය ඉව වැටුණු සැණින් අලින් පුදුමයට පත් වීම ය. ඒ , ඒ වන විටත් එම ඇතින්න ඔවුන් පිටුපසින් ගමන් කරමින් සිටීම නිසාය.

"අප සැලකිල්ලට ගන්නෙ රැහේ සිල්ලන් ම සිටින්නේ කොහේද යන්න පිළිබඳ සෑම අලියකුම දිගින් දිගටම සිය මතකය අලුත් කරන්නේ ද යන්නත්, කිසියම් නිශ්චිත අලියකු ඔවුන්ගේ මුත්‍රා සාම්පලයක් මඟින් හඳුනාගත හැකි ද යන්නත් පිළිබඳයි. මේ සම්බන්ධයෙන් අලින් වෙනත් ආකාරයක ප්‍රතික්‍රියා දක්වයි ද යන්න පිළිබඳත් මෙහි දී සලකා බැලුවා. සහකාර පර්යේෂණ ආචාර්ය ලුසී බේට්ස් ප්‍රකාශ කළේ ය.

දුර ඈත සිටින පවුලේ සාමාජිකයකු ගේ මුත්‍රාවලට පවා අලි ප්‍රතික්‍රියා දක්වති. එම ප්‍රදේශයේ ගැවසීමට පවා නොරුස්සති.

ආචාර්ය බර්න් පවසන පරිදි එකිනෙකා පිළිබඳ සොයා බැලීම මිනිසාට පවා අපහසු ක්‍රියාවක්ව පවතිද්දී දහවල ඉතා දුර්වල පෙනුමක් සහිත අලියාට එය ඉතා අපහසු කටයුත්තකි.

දරුවන් තිදෙනෙක් හා ස්වාමිපුරුෂයා සමඟ සුපිරි වෙළෙඳසැලක සිටින අම්මා කෙනෙක් ගැන බලනවිට ළමයින් පිළිබඳ සොයා බැලීමට ඇයට ඉමහත් ආයාසයක් දැරීමට සිදුවේ. එනිසා ඔවුන්ගේ ආරක්ෂාව ඔවුන්ටම සපයා ගත හැකි ස්ථානයක් පිළිබඳ ඇය සොයා බලනු ඇත. එහෙත් 20 ක්, 30 ක් අතර සංඛ්‍යාවක් සිටින අලි රංචුවක වුවත් එය මැනැවින් සිදුවේ. ඔහු බී.බී.සී යට පැවසුවේය.

මහාචාර්ය බර්න් පවසන පරිදි මිනිසුන්ට වඩා වාසිදායක හේතූන් දෙකක් අලින් සතුව ඇත. පළමුවැන්න ඉව ඇල්ලීමට ඇති අනගි ශක්තියයි. දෙවැන්න මතකයේ තබාගැනීම පිළිබඳ අති විශේෂ හැකියාව යි. "අලි සමත්වන්නේ දිගුකල් මතකයේ තබා ගැනීමට නොව එදිනෙදා කටයුතු සම්බන්ධව මතකයේ තබා ගැනීමට විය හැකිය. ඒ එය වැදගත් වන හෙයිනි. " මහාචාර්ය බර්න් පවසයි.

**අන්තර්ජාලය ඇසුරෙනි**

**ඩබ්ලිව්.ඒ.ඩී.දිසානායක**

